# 1.44 සිංහල අක්ෂර කෙරෙහි බලපෑ දක්ෂිණ භාරතීය ආභාෂය (ආරම්භයේ සිට ක්‍රි.ව. 07 වන සියවස දක්වා විචාර පූර්වක විමර්ශනයක්)

පූජ්‍ය ගල්වැවේ විමල බන්ති හිමි
ශ්‍රී බෝධියංගනාරාමය, සපුගහ/තම්මිට, හුණුමුල්ල.

## ABSTRACT

සිංහල අක්ෂර මාලාව සකස්වීමේ ක්‍රියාවලිය අධ්‍යයනය කළ බොහෝ විද්වතුන් ප්‍රකාශ කරන්නේ විවිධ කාල පරාශයන්හිදී ඒවාහි ස්වරූපය වෙනස්වීමෙහිලා ඉන්දීය ආභාෂය බොහෝවිට බලපාන්නට ඇති බවයි. එහෙත් අක්ෂර මාලාව ලාංකීය වශයෙන් ද වර්ධනය වූ බවට ද ඇතැමුන් මත ඉදිරිපත් කොට තිබේ. මේ මත දෙක විමර්ෂණය කොට සිංහල අක්ෂර මාලාවේ වර්ධනය සිදුවූ ආකාරය නිවැරදිව පෙන්වා දීමට මේ නිබන්ධනයෙන් අපේක්ෂා කෙරේ.

ලාංකීය අක්ෂරයන් වර්ධනය වීමෙහිලා බලපෑ සාධක අතර කාලය යන සාධකය මෙහිදී ප්‍රධාන වන බවත්, ලිපි කෙටූ ස්ථානයන් හා ඒවාට ලඟා වීමට හැකි සුගමතාවය හා දුගමතාවයත්, යන කරුණු අක්ෂර සකස් වීමේදී කෙලෙස බලපාන්නේද යන්න පිළිබඳවත් මෙහිදී අවධානය යොමු කර තිබේ.

මීට අමතරව අක්ෂර කෙටූ මාධ්‍යයන් හා ඒවාහි දෘඪතාවය, මටසිලුටුතාවය යන කරුණු කෙරෙහිද මෙහිදී අවධානය යොමු කෙරේ. එම තත්වයන් අක්ෂරවල ස්වරූපය වෙනස්වීමට කෙබඳු බලපෑමක් කළේද යන්න පිළිබඳවද, හායන පක්ෂය කළ බලපෑමද මෙහිදී විචාර පූර්වකව ඉදිරිපත් කෙරේ.

අක්ෂරවල ස්වරූපය වෙනස්වීමෙහිලා බලපෑ සාධක අතර අක්ෂර සටහන් කළ ශිල්පීන්ගේ කලා කුශලතාවයන් පිළිබඳවද මෙහිදී අවධානය යොමු කරන අතර ගුරුකුල සංකල්පය කෙසේ මේ කෙරෙහි බලපෑවේ ද යන්න කෙරෙහි අවධානය වැඩිදුරටත් යොමු කෙර්.

දක්ෂිණ භාරතීය ආභාෂය ලැබීයැයි පෙන්වීමට ඇති සාධක සාකච්ඡා කරන අතරම අශෝක පූර්ව යුගයේ සිටම ලක්දිව අක්ෂර කළාවක් තිබුනේදැයි විද්වතුන් ගෙනහැර පාන්නාවූ මතයන් සියුම් ලෙස විමර්ශනයට ලක් කරමින්, ක්‍රිස්තු වර්ෂාරම්භයත් සමගම අක්ෂර රටාවේ සිදුවූ වෙනස්වීම් සඳහා දේශීයව සිදුවූ විපර්යාශයන් හේතුවූයේයැයි ගෙන එන මතය එක් ප්‍රබල මතයක් සේ සලකමින් දක්ෂිණ භාරතීය ආභාෂය පිළිබඳ මතය ඛණ්ඩනය වන්නේදැයි මෙහිදී විමර්ෂණය කෙරේ. එසේම අක්ෂර කිහිපයක් කෙරෙහි පමණක් මෙකී ආභාෂය ලැබුවේනම් එයට හේතු ලෙස උගතුන් පෙන්වා දෙන මතයන්හි ඇති ඌනතාවයන් පිළිබඳවද මෙහිදි සංවේදී වන අතරම ක්‍රියා පටිපාටීන් කිහිපයක බලපෑමට යටත්ව අක්ෂර විකාශනය සිදුවූයේයැයි ගෙන එන මතය වඩාත් ප්‍රබල බව පෙන්වීමට මෙහිදී වැඩි අවධානයක් යොමුකරනු ලැබේ.

මෙකී පර්යේෂණය තුළින් අදාළ කාලපරාශය තුළ අක්ෂරයන්ගේ පරිණාමයට දේශීයව බලපෑ හේතුන් වැඩි බව සනාථ කිරීම විෂයෙහි මෙම අධ්‍යයනය ප්‍රධාන වශයෙන්ම වෙන්වේ.